**ශීර්ෂය - 325 ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර අවසන් අග්‍රිම සාරාංශය **(SA - 70)** අනුව අග්‍රිම වටිනාකම රු.**289,636,521** ක් වුවද **(ACA -3)** ආකෘතිය අනුව දක්වා තිබුණේ රු.**288,782,628** කි. ඒ අනුව අග්‍රිම ලැබීම් හා අග්‍රිම පියවීම් රු. **853,893** ක් අඩුවෙන් දක්වා තිබුණි. | විෂමතාවය නිවැරදි කිරීම සඳහා උපදෙස් ලබා දෙන ලදී. | භාණ්ඩාගාර අවසන් සාරාංශයේ සඳහන් ශේෂයන් මත පදනම්ව අග්‍රිම ගිණුම පිළියෙල කළ යුතු බව. |
| (ආ) | භාණ්ඩාගාර අවසන් ශේෂ පිරික්සුමේ (7002/409/21) වෙනත් මූලාශ්‍ර මගින් අග්‍රිම ලැබීම් වටිනාකම රු.12,858,521 ක් වුවද **(ACA -**3) ආකෘතියෙහි දක්වා තිබුණේ රු.12,004,628 කි. ඒ අනුව වෙනත් මූලාශ්‍ර මගින් අග්‍රිම ලැබීම් රු.853,893 ක් අඩුවෙන් දක්වා තිබුණි. | විෂමතාවයන් ඉදිරියේදී සිදු නොවීම සඳහා උපදෙස් ලබා දෙන ලදී. | අග්‍රිම ලැබීම් නිවැරදිව සටහන් කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------------

## 2.1 ප්‍රතිපාදන උපයෝජනය

---------------------------

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 23 දිනැති අයවැය චක්‍රලේඛ අංක 07/2020 හි 02 ඡේදය ප්‍රකාරව හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 05 ඡේදයේ **5.1** උප වගන්තියට අනුව වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කර දී ඇති පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන සීමාවන් නොඉක්මවන පරිදි වියදම් කළමනාකරණය කරගැනීම ගණන් දීමේ නිලධාරීන්ගේ වගකීම බව දක්වා තිබියදී සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි සහ ඉදිකිරීම් සඳහා වැය විෂය අංක 325-1-1-0-2104 යටතේ සපයා තිබූ රු.10,000,000 ක්වූ මූලික ප්‍රතිපාදනයට අමතරව උප ව්‍යාපෘති 4 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු.75,000,000 ක ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. | සමාලෝචිත වර්ෂයේ ලබා දුන් ප්‍රතිපාදනයට අමතරව නැවත ප්‍රතිපාදන වෙන් කරන ලදී. | නීති රීති රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානයන්වලට අනුකූලව කටයුතු කළ යුතු බව. |
| (ආ) | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කිරීම ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වුවද, වැය විෂයන් 09 ක් සඳහා මුදල් රෙගුලාසි 66 මගින් රු.**16,303,000** ක්වූ ප්‍රතිපාදන වෙන්කර ගෙන තිබුණි. | පුරෝකතනය නොකළ කාර්යයන් සඳහා මූල්‍ය ප්‍රතිපාදන මාරු කිරීම් යොදා ගන්නා ලදී. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ඇතුළත් වෙනත් පුනරාවර්තන වියදම් යටතට ඇතුළත් විය යුතු රු. 8,000 ක රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වියදම අනෙකුත් භාණ්ඩ හා සේවා යටතේ දක්වා තිබුණි. | සටහන් තබා ගන්නා ලදී. | වියදම් නියමිත වැය විෂයයන් යටතේ සටහන් කළ යුතු බව. |
| (ඈ) | නිශ්චිතව හඳුනාගත හැකිව තිබූ රු.331,587 ක්වූ පුනරාවර්තන ස්වභාවයේ වියදම් මුලධන වියදම් යටතේ ගෙවීම් සිදුකර තිබුණු අතර වියදම් දැරීමේදී රු.**2,937,617** ක්වූ මූලධන වියදම්, වියදමේ ස්වභාවය අනුව නියමිත වැය විෂයන් යටතේ වර්ගකර නොතිබුණි. | අයවැය නිලධාරි සමඟ සම්බන්ධීකරණයවී කටයුතු යොදන ලදි. | -එම- |

**2.2** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර බැදීම් හා බැරකම් ප්‍රකාශය (SA - 92) අනුව වර්ෂය අවසානයේ බැදීම් හා බැරකම් වටිනාකම රු.3,134,972 ක් වුවද සටහන (iii) ආකෘතිය අනුව එම වටිනාකම රු.741,042 ක් විය. ඒ අනුව බැදීම් හා බැරකම් රු. 2,393,930 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී බැරකම් නිසි පරිදි වාර්තා කිරීමට සටහන් තබා ගන්නා ලදී. | බැරකම් නිසි පරිදි සටහන් කළ යුතු බව. |

**2.3** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | | **අනුකූල නොවීම** | | |
| 2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු පනත | | | | |
| II කොටස 4 (උ) ඡේදය | (අ) | සමුද්‍රාසන්න සහ සමුද්‍රීය පරිසරය සංරක්ෂණය සහ ආරක්ෂා කිරීම සඳහා සහය වීම වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යයක් සහ කර්තව්‍යයක් වුවද එය නිසි සහ සක්‍රීයව ක්‍රියාත්මක වීම අවම මට්ටමක පැවතුණි. | ආරක්ෂක අමාත්‍යාංශය ලේකම් වෙත විස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කර ඇත. | වාර්තා ඉදිරිපත් කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. සක්‍රීයව දායක වීම අවශ්‍ය බව. |
| III කොටස 11 ඡේදය | (ආ) | උපදේශක සභාවක් ස්ථාපිත කළ යුතු වුවද මේ දක්වාම එම සභාව ස්ථාපිත කර නොතිබුණි. | විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත. | උපදේශක සභාවක් පත්කිරීම මේ දක්වාම ඉටුවී නැති බව ලිපිය මගින් දන්වා ඇත. එබැවින් වහාම උපදේශක සභාවක් පත්කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| 12 ඡේදය | (ඇ)උපදේශක සභාව විසින් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කටයුතු පිළිබඳ සමාලෝචනයක් සිදුකර අමාත්‍යවරයා වෙත ඒ පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද මේ දක්වා එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | උපදේශක සභාවක් ස්ථාපිත කර නොමැති බැවින් වාර්තාවක් ඉදිරිපත් කිරීමට නොහැක. | අදාළ වාර්තා නියමිත කාලය තුළ ඉදිරිපත් කළ යුතු බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ රෝහණ ආයතනය තුළ උසස් පුහුණු හා පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු. මිලියන **30.09** ක මුදලක් වැයකළ පසුව **2017** ජූලි **22** වන දින සිට අතහැර දමා තිබුණු ව්‍යාපෘතියේ වැඩකටයුතු **2021** වර්ෂයේදී නැවත ආරම්භ කර තිබුණි. **2022** අප්‍රේල් වන විට මෙම ව්‍යාපෘතිය සඳහා දරා තිබූ මුළු වියදම රු. මිලියන **104.8** ක් වී තිබුණි. දෙපාර්තමේන්තුව සඳහා ඉතාමත්ම අත්‍යාවශ්‍ය ව්‍යාපෘතියක් වන මෙම පුහුණු හා පරිපාලන ගොඩනැගිල්ල කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය පියවර ගතයුතු බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ. | මෙම වර්ෂයේදි අත්‍යාවශ්‍ය ඉදිකිරීම් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. | ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු බව. |

**3.2 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) ප්‍රකාරව, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී සංශෝධනය කළ යුතු වුවද දෙපාර්තමේන්තුවේ රෝහණ ආයතනයේ උසස් පුහුණු හා පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ තොරතුරු ඇතුළත් කර | අදාළ යාවත්කාලින කිරීම් නිසි පරිදි සිදු කරනු ලබයි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව අවශ්‍ය යාවත්කාලීන කිරීම් කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) ප්‍රකාරව, සියලුම ආශ්‍රිත වියදම් ඇතුළු මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කළ යුතු වුවද, යථෝක්ත ප්‍රසම්පාදනයට අදාළව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) ප්‍රකාරව, ප්‍රසම්පාදනය ආරම්භවීමේ අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ලේඛනයක් පිළියෙල කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | වගකිවයුතු නිලධාරීන් හට උපදෙස් ලබා දී ඇත. | -එම- |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ප්‍රකාරව, ලංසු විවෘත කිරීමට අදාළ මූල්‍යමය තොරතුරු සහ එක් එක් ලංසු පිළිබඳ තොරතුරු (විධිමත් පරිදි සම්පූර්ණ කරනලද මුද්‍රා තබන ලද ලංසු ඉදිරිපත් කර තිබේද , විකල්ප ලංසු ඉදිරිපත් කර තිබේද යනාදිය ) නියමිත ආකෘති පත්‍රයක වාර්තාගත කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අපේක්ෂිත පරිදි වාර්තාවක් පවත්වාගෙන යාමට උපදෙස් ලබා දී ඇත. | -එම- |
| (ඈ) | නිශ්චිත ගබඩා ක්‍රමයක් යටතේ අවශ්‍යවන ද්‍රව්‍ය ප්‍රමාණයන් හඳුනාගෙන ඒ යටතේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කර අදාළ සැපයුමෙන් අවශ්‍යවන ප්‍රමාණවලින් ඒ ඒ වෙලාවේදී ගෙන්වා ගැනීම වෙනුවට වරින් වර එක් එක් අයිතමය හෝ එකම අයිතමයෙන් කොටස් වශයෙන් මිලදී ගැනීමට ලිපිගොනු විවෘත කර තිබීම හේතුවෙන් විශාල ප්‍රමාණයක් මිලදී ගැනීමේදී හිමිවන වට්ටම්, අවම මිලක් හා ගුණාත්මක භාණ්ඩ මිලදී ගැනීම ආදී ප්‍රතිලාභ ලබාගැනීම කෙරෙහි අවධානය යොමුවී නොතිබුණි. | ඉදිරියේදී අදාළ කටයුතු නිසියාකාරව පුරෝකථනය කිරීමට උපදෙස් ලබා දී ඇත. | -එම- |

**3.3** **වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------------------------------- | ---------------------------- | ------------------------------ |
| (අ) | අනෙකුත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලට අයත් ඉඩම් පර්චස් **1159.92** ක් (හෙක්ටයාර් **1.91825**) නිසි පරිදි පවරාගැනීමකින් තොරව පරිහරණය කර තිබුණි. | නිසි පරිදි පවරාගැනීමේ කටයුතු සිදුකරමින් පවතී. | නිසි පරිදි පවරාගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ක්‍රියාකාරී තත්ත්වයේ නොමැති වටිනාකම රු. මිලියන **163.2** ක්වූ නෞකා/යාත්‍රා **10** ක් සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග කඩිනම් කිරීම කෙරෙහි අවධානය යොමුවිය යුතු බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ. | කඩිනමින් ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරිමට කටයුතු කෙරේ. | ක්‍රියාකාරී තත්ත්වයට පත්කිරීමේ කටයුතු කඩිනම් කළ යුතු බව**.** |

**3.4 කළමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙරළ ආරක්ෂක **'වරුණ'** ආයතනයේ ආහාර ගබඩාවේ ඇති වියළි ආහාර ද්‍රව්‍ය සෞඛ්‍ය ආරක්ෂිතව ගබඩා කර ගැනීමට නොහැකි වී තිබුණි. මීයන් හා විවිධ කෘමි සතුන් විසින් වියළි ආහාර ද්‍රව්‍ය විනාශ කර ඇති බව නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් කඳවුරේ රාජකාරී සිදුකරන සියළුම වෙරළ ආරක්ෂක නිලධාරීන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ දැඩි ගැටළුකාරී තත්ත්වයක් මතුවී ඇති අතර**,** ආහාර ද්‍රව්‍ය විනාශවීම නිසා තොග ගණන් නිසි ලෙස පවත්වා ගෙන යාමේ ගැටළුකාරී තත්ත්වයකට ද මුහුණ දීමට සිදුවී තිබුණි. | ඉදිරියේදී ස්ථාපිත කිරිමට නියමිත යෝජිත ගොඩනැගිල්ලෙහි ආහාර ගබඩාව සඳහා වෙන් කිරීම් කෙරේ. | ආහාර ගබඩාවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු කඩිනම් කළ යුතු බව**.** |

**3.5 පරිසර විගණනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නීති විරෝධී ක්‍රියාවන් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් ධීවර යාත්‍රා , උපකරණ හා ආම්පන්න ධීවර වරායන්වල රඳවා තිබියදී ක්ෂණික ජල පිරීමක් සිදුවුවහොත් තෙල් කාන්දුවක් ඇතිවීමට ඉඩ ඇති බවත්, වැසි ජලය යාත්‍රා තුළ එකතු වීමෙන් ඩෙංගු මදුරුවන් ව්‍යාප්තිය වැඩිවීමත් ඉන් අහිතකර පාරිසරික , සෞඛ්‍යමය හා ආර්ථික බලපෑම් රාශියකට මුහුණ දීමට සිදු විය හැකි බවත් එම අවදානම අවම කර ගැනීමට පියවර ගෙන නොමැති බවත් නිරීක්ෂණය විය. | අධිකරණයේ විශේෂ අවසරය මත වරාය තුළ වූ ගොඩබිම් ස්ථානයක නියමිත පරිදි ස්ථානගත කෙරේ. | අත්අඩංගුවට ගෙන ඇති යාත්‍රා, උපකරණ හා ආම්පන්න ගොඩබිම් ස්ථානයක නියමිත පරිදි ස්ථානගත කිරීමට කටයුතු කළ යුතු බව**.** |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව සතුව දිවයින වටා අනුබණ්ඩ 17 ක් ස්ථානගතවී තිබුණද අභ්‍යන්තර විගණනය සඳහා අවශ්‍ය මානව සම්පත ප්‍රමාණවත් පරිදි උපයෝජනය කර නොතිබීම හේතුවෙන් පුළුල් විගණනයක් කිරීමට ඇති අවස්ථාව අවම මට්ටමක පැවතුණි. | එකඟ වේ. | අභ්‍යන්තර විගණන අංශය සඳහා ප්‍රමාණවත්වූ මානව සම්පත යෙදවීමට කටයුතු කළ යුතු බව. |

## 5. මානව සම්පත් කළමණාකරනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අනුමත කාර්ය මණ්ඩලය තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් වූ ගණකාධිකාරී තනතුර වැඩ බැලීමේ පත් වීමක් ලෙස දිගින් දිගටම පත් කර තිබුණි. | අනුමත කාර්යය මණ්ඩලය තුළ ජේෂ්ඨ මට්ටමේ තනතුර දැනට පුරප්පාඩු වී නොමැත. | වැඩ බැලීමේ පත් වීමක් ලෙස දිගින් දිගටම පත් කර ඇති ජේෂ්ඨ මට්ටමේ තනතුර ස්ථිර තනතුරක් බවට පත් කල යුතු බව. |